# භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව 2023

## කැලණිය විශ්වවිද්‍යාලය
## මානවශාස්ත්‍ර පීඨය - වාග්විද්‍යා අංශය

ඉහත සඳහන් පාඨමාලාව සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කර ගැනීම පිණිස 2023. 05. 22 සිට 2023. 06. 23 දින තෙක් සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගැනීම සිදු කෙරේ.

මෙම පාඨමාලාව භාෂා පරිවර්තනය සහ භාෂණ පරිවර්තනය පිළිබඳව සෛද්ධාන්තික දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමට සුදුසු වන පරිදි සකස් කර ඇත.

### භාෂා පරිවර්තන පාඨමාලාව -

I. **දෙමළ - සිංහල පරිවර්තන පාඨමාලාව** *(සිංහල සහ දෙමළ භාෂා දැනුම ඇති අපේක්ෂකයන්ට)*

II. **ඉංග්‍රීසි - සිංහල පරිවර්තන පාඨමාලාව** *(ඉංග්‍රීසි සහ සිංහල භාෂා දැනුම ඇති අපේක්ෂකයන්ට)*

**පාඨමාලාවේ කාලය:** අධ්‍යයන වර්ෂ එකකි. සෙනසුරාදා දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා දේශන පැවැත්වේ. *දේශන මාර්ගගත ක්‍රමයට* ***(online)*** *සහ පන්තිකාමර දේශන වශයෙන් ද කැලණිය විශ්වවිද්‍යාලයේ දී පැවැත්වෙනු ඇත.*

**පාඨමාලා ගාස්තුව:** රු. 65,000/ කි. (රුපියල් හැටපන් දහසකි) *(පළමු වැනි වාරිකය රු. 35,000.00ක් ඇතුළත් වීමේ දී හා දෙවැනි වාරිකය රු. 30,000.00ක් මුල් මාස තුන ඇතුළත ගෙවිය යුතු ය.)*

**අයදුම් කිරීම සඳහා අවම සුදුසුකම්:** අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් සමත්වීම හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ සේවා අවශ්‍යතාව මත වසර 10ක සේවා පළපුරුද්ද

**පාඨමාලාවට තෝරා ගැනීම:** වාග්විද්‍යා අංශය මගින් පවත්වන සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීම

**පාඨමාලාවේ ආරම්භය:** 2023 සැප්තැම්බර්

**අයදුම්පත්‍ර ගාස්තුව:** "භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව - 2023 අයදුම්පත් ගාස්තුව" යනුවෙන් සඳහන් කොට කැලණිය විශ්වවිද්‍යාලයේ, අංක 055-1-001-1-0667549 දරන එකතු කිරීමේ ගිණුමට බැර වන පරිදි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු.750.00ක් ගෙවා රිසිට් පත ලබා ගත යුතුය.

**අයදුම්පත්‍ර ලබාගන්නා ආකාරය:** ***dtri@kln.ac.lk*** යන විද්‍යුත් ලිපිනයට ඔබගේ අයදුම්පත් ගාස්තුව ගෙවන ලද රිසිට් පතෙහි ස්කෑන් පිටපතක් **(Scanned copy)** එවූ විට එම විද්‍යුත් තැපැල් ලිපිනයට අප විසින් අයදුම්පත්‍රය හා ගූගල් පෝරමය එවනු ලැබේ.

**අයදුම්පත්‍ර යොමු කරන ආකාරය:** මාර්ගගත ක්‍රමයට **(online)** සම්පූර්ණ කරන ලද ගූගල් පෝරමය **(google form) submit** කළ යුතු වන අතර අයදුම්පත්‍රය බාගත කර **(download)** සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඔබගේ
1. උප්පැන්න සහතිකයේ පිටපතක්, 2. ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, 3. උසස් පෙළ විභාග සහතිකයේ පිටපතක් සහ 4. මහජන බැංකුවට රු. 750.00 ක මුදල ගෙවා ලබා ගත් රිසිට් පත සමඟ අමුණා

**2023. 06. 23** දින හෝ ඊට පෙර ලැබෙන සේ **සම්බන්ධීකාරක, භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව, වාග්විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර, කවරයේ ඉහළ වම් කෙළවරේ **"භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත්‍රය - 2023"** යනුවෙන් සඳහන් කළ යුතුය.

---

- ***බඳවා ගනු ලබන විද්‍යාර්ථීන් සංඛ්‍යාව සීමාසහිත බැවින් අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය.***
- ***අයදුම්පත් ලැබෙන අනුපිළිවෙළ මත ප්‍රමුඛතාව හිමි වේ.***
- ***පාඨමාලාව සම්බන්ධයෙන් වැඩි විස්තර 0112 908786 දුරකථන මගින් ලබා ගත හැකිය.***

*ලේඛකාධිකාරී, කැලණිය විශ්වවිද්‍යාලය - 2023.05.21*